# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2369/07 - 2024 ජනවාරි මස 29 වැනි සඳුදා - 2024.01.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත**

22අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 22අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින් මේ පනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය බලපත්‍රලත් කලාපයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2024 ජනවාරි මස 24 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ.

**උපලේඛනය**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ පිළිවෙලින් මිරිජ්ජවිල, ආරබොක්ක, පල්ලේ බෙරගම, කිරිවිල, කොහොලන්කල හා හම්බන්තොට යන ග්‍රාමයන්හි පිහිටා ඇත්තා වූ ද, "**ආරබොක්ක**" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජල ශාස්ත්‍රීය මිනුම් අංශයේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එස්. ආර්. ඉලේපෙරුමාච්චි විසින් සකස් කරන ලද 2016 ජනවාරි මස 22 දිනැති අංකඃ S/Mis/450 දරන පිඹුරේ ලොට් අංක 1, 2, 3, 4 සහ 5 ලෙස ලකුණු කර ඇත්තා වූ ද, පහත දැක්වෙන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස් වේ. එනම්:-



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ලොට් අංක 01.**

*උතුරට* :- මහවැලි අධිකාරියේ ඉඩම, කටු වැව සහ ඇළ ද ;

*නැගෙනහිරට* :- මාර්ගය (අධිවේගී මාර්ගය) ද ;

*දකුණට* :- මාර්ගය (අධිවේගී මාර්ගය), මහවැලි ඉඩම සහ අඩි 100 මාර්ගය (අධිවේගී මාර්ගය) ද ; සහ

*බස්නාහිරට* :- අඩි 100 මාර්ගය (අධිවේගී මාර්ගය) සහ මහවැලි අධිකාරියේ ඉඩම ද ;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද,

ප්‍රමාණයෙන් අක්කර පන්සිය දාහතයි රූඩ් එකයි පර්චස් විසිහය (අ: 517 ; රූ: 01 ; පර්: 26) ක් හෙවත් හෙක්ටයාර් දෙසිය නවයයි දශම තුනයි නවය (හෙක්ටයාර් 209.39) ක් වූ ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස; සහ

**ලොට් අංක 02.**

*උතුරට* :- මහවැලි අධිකාරියේ ඉඩම සහ මාර්ගය (අධිවේගී මාර්ගය) ද ;

*නැගෙනහිරට* :- ලොට් අංක 3 ද ;

*දකුණට* :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම ද ; සහ

*බස්නාහිරට* :- අඩි 100 මාර්ගය (අධිවේගී මාර්ගය) සහ මහවැලි අධිකාරියේ ඉඩම ද ;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද,

ප්‍රමාණයෙන් අක්කර දෙසිය දාහතයි රූඩ් තුනයි පර්චස් තුන (අ: 217 ; රූ: 03 ; පර්: 03) ක් හෙවත් හෙක්ටයාර් අසූඅටයි දශම එකයි තුනයි (හෙක්ටයාර් 88.13) ක් වූ ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස; සහ

**ලොට් අංක 03.**

*උතුරට* :- ලොට් අංක 2 සහ මාර්ගය (අධිවේගී මාර්ගය) ද ;

*නැගෙනහිරට* :- ලොට් අංක 4 ද ;

*දකුණට* :- ලොට් අංක 4, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම සහ ලොට් අංක 2 ද ; සහ

*බස්නාහිරට* :- ලොට් අංක 2 සහ මාර්ගය (අධිවේගී මාර්ගය) ද ;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද,

ප්‍රමාණයෙන් අක්කර එකසිය එකයි රූඩ් දෙකයි පර්චස් තිස්තුන (අ: 101 ; රූ: 02 ; පර්: 33) ක් හෙවත් හෙක්ටයාර් හතලිස් එකයි දශම එකයි හය (හෙක්ටයාර් 41.16) ක් වූ ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස; සහ

**ලොට් අංක 04.**

*උතුරට* :- ලොට් අංක 3, මාර්ගය (අධිවේගී මාර්ගය) සහ ලොට් අංක 5 ද ;

*නැගෙනහිරට* :- ලොට් අංක 5 ද ;

*දකුණට* :- ලොට් අංක 5, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම සහ ලොට් අංක 3 ද ; සහ

*බස්නාහිරට* :- ලොට් අංක 3 ද ;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද,

ප්‍රමාණයෙන් අක්කර එකසිය අනූ එකයි පර්චස් විසිපහ (අ: 191 ; රූ: 0 ; පර්: 25) ක් හෙවත් හෙක්ටයාර් හැත්තෑහතයි දශම තුනයි හය (හෙක්ටයාර් 77.36) ක් වූ ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස; සහ

**ලොට් අංක 05.**

*උතුරට* :- මාර්ගය (අධිවේගී මාර්ගය) ද ;

*නැගෙනහිරට* :- මාර්ගය (ශ්‍රී ලංකා වරාය අධිකාරිය) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම ද ;

*දකුණට* :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම ද ; සහ

*බස්නාහිරට* :- ලොට් අංක 4 ද ;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද,

ප්‍රමාණයෙන් අක්කර පන්සිය හතයි රූඩ් දෙකයි පර්චස් විසිඅට (අ: 507 රූ: 02 ; පර්: 28) ක් හෙවත් හෙක්ටයාර් දෙසිය පහයි දශම හතරයි පහ (හෙක්ටයාර් 205.45) ක් වූ ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස; වේ

2016 ජනවාරි මස 22 දින අංක : S/Mis/450 දරන පිඹුරට අනුව සම්පූර්ණ බිම් ප්‍රමාණය අක්කර එක්දහස් පන්සිය තිස්පහයි රූඩ් දෙකයි පර්චස් තිස්පහ (අ: 1535 ; රූ: 02 ; පර්: 35) ක් හෙවත් හෙක්ටයාර් හයසිය විසි එකයි දශම හතරයි නවය (හෙක්ටයාර් 621.49) ක් වූ ඉහතකී ලොට් අංක 1, 2, 3, 4, සහ 5 දරන ඉඩම් කොටස් වේ.

EOG 01 - 0227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.